**හපුතලේ නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
-------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 08 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 06 දින නගර සභාවේ ලේකම් වෙත යවා ඇත.

1.2 **මතය**
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හපුතලේ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මන්ත්‍රී දීමනා වැය විෂයක් නොමැති වුවත්, රු.150,000 ක වියදමක් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් කාර්යාල උපකරණ 13 ක වටිනාකම වූ රු.347,999 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) බැකෝ ලෝඩරය ප්‍රවාහනය කිරීම සඳහා දරන ලද රු.44,430 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේදී දරන ලද රු.520,281 ක් වටිනා වියදම් 09 ක් ප්‍රවර්තන වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී දරන ලද රු.369,178 ක් වටිනා වියදම් 13 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(ඊ) පළාත් පාලන සේවකයන්ගේ විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.216,147 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(උ) කර්මාන්ත ණයහිමියන් 05 දෙනෙකු වෙනුවෙන් රු.739,215 ක ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ අවසාන තොග වටිනාකම රු.97,202 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(එ) ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු.60,039 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයේ මුද්දර ගාස්තු ඌන වෙන්කිරීම් රු.208,325 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු තානායම් කළමනාකරණ ගාස්තු රු.150,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඕ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් වටිනාකම රු.87,422 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසැඳුනු පාලන ගිණුම්**

---------------------------------

පහත දැක්වෙන නොසැසඳීම් නිරීක්ෂණය විය.

(අ) සේවක ණය උපලේඛනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශන අනුව ශේෂය රු.36,780 කින් නොසැසඳුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආයෝජන හා ඇප තැන්පත් වල වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම රු.8,014 කින් නොසැසඳුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව විවිධ තැන්පතු ශේෂය හා උපලේඛන අනුව ශේෂය රු.786,107 කින් නොසැසඳුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව මුදල් හා මුදල් සමාන දෑ ශේෂය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.74,824 කින් නොසැසඳුනි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 16,679,661 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකමරු.27,358,293 ක් විය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීතිරීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) නගර සභා ආඥා පනතේ (255 අධිකාරිය) | |
| 77 වගන්තිය | අනවසර ඉදිකිරීම් 08 ක් සම්බන්ධව අදාල පාර්ශවයන්ට විරුද්ධව කටයුතු කොට නොතිබුණි. |
| (ආ) මෝටර් රථ ප්‍රවාහන පනතේ අධිකාරිය 203 වගන්තිය | සභාව සතු වාහන 11 ක් සඳහා විසින් ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි

-----------------------------------

(i) මුදල් රෙගුලාසි 371 සභාව විසින් අවස්ථා 17 කදී විවිධ පාර්ශවයන් වෙත ගෙවන ලද අත්තිකාරම් රු.305,138 ක් 2015 දෙසැම්බර් 31 වන විටද පියවාගෙන නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| | (ii) | මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වූ රු.114,112 ක් වටිනා තැන්පතු 22 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | | රජයේ ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්ති | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලැබූ, සේවය හැර ගිය හා මියගිය සේවකයින් 21 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.67,825 ක් අයකරගෙන නොතිබුණි. |
| (ඉ) | | 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක 06 ක් හා ඊට අදාල උපාංග සම්බන්ධයෙන් අංක පරිගණක උපාංග ලේඛනයක් නඩත්තු කර නොතිබුණි . |
| (ඊ) | | 2010 මැයි 25 දිනැති අංක 4/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්ගේ හා 2014 දෙසැම්බර් 08 දිනැති අංක 1/8/1/31(1) දරන ලිපිය | සභාවේ සේවයේ නියුතු දෛනික වැටුප් ලබන සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන් 06 දෙනෙකු වෙනුවෙන් 2015 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා මාස 08 කට අදාලව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට රු.221,709 ක් ගෙවා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,052,835 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,954,082 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 01 දිනට පැවති හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 51 සිට සියයට 24 තරම් දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර දෙකකට අධික කාලයක සිට පවතින හිඟ වරිපනම් බදු රු.2,761,870 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මස් කඩ හා මාළු කඩ ටෙන්ඩර් කරුවන්ගෙන් 2001 වර්ෂයේ සිට සභාවට අයවිය යුතු රු.1,304,026 ක් අයකර ගෙන නොතිබුණි.

(ඈ) ප්‍රචාරක දැන්වීම් පුවරු පවත්වාගෙන යාම වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ලැබිය යුතු රු.116,400 ක ආදායම් 2015 සැප්තැම්බර් 22 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඉ) නගර සහා ආඥා පනතේ 164(4) වගන්තියේ නියමයන් අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟව පවතින රු.4,221,521 ක ආදායම් සම්බන්ධයෙන් ගෙවීම් පැහැර හරින ලද පුද්ගලයන්ට විරුද්ධව කටයුතු කොට නොතිබුණි.

(ඊ) පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ආයතන 09 ක් සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ අංක 1523/16 දරන 2008 ජනවාරි 25 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව එම බලපත්‍ර ලබා නොදී වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

(උ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය අනුව පළාත් පාලන ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන සියළුම වෙළඳපොළ කඩ කාමරවල මාසික බදු කුලී ප්‍රධාන තක්සේරුකරු ලවා අවුරුදු 5 කට වරක් තක්සේරුවක් සිදුකර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය වන විට ලියාපදිංචි කර තිබූ ත්‍රිරෝද රථ 129 කින් සභාවට ලබාගත හැකිව තිබූ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.310,833 ක් සහ මුද්දර ගාස්තු රු.816,610 ක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1. **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1999 සිට 2007 දක්වා කාලයට අදාලව නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු තානායම් කුලී රු.3,974,194 ක් හා සභා අරමුදලින් පියවන ලද තානායම් විදුලි ගාස්තු රු.74,824 ක් 2015 සැප්තැම්බර් 22 වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේ දී හඳුනාගත් ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103, 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, ඉදිරිපත් කරන ලද නිර්දේශයන් 2015 සැප්තැම්බර් 22 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2015 සැප්තැම්බර් 22 විගණන දින වන විටත් ක්‍රියාකාරි තත්ත්වයේ පැවති ගනක යන්ත්‍ර (Scientific Calculator) 02 ක් විනාශ කිරීමට නිර්දේශ කර තිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් 19 දින අනතුරට පත්ව තිබූ වෑන් රථයක් අළුත්වැඩියාව සඳහා සභා අරමුදලින් රු.300,000 ක් වැයකර තිබුණද, රක්ෂණ වන්දි වශයෙන් රු.175,000 ක් පමණක් ලැබී තිබුණු අතර එයට අමතරව වැයවූ රු.125,000 ක මුදල් පියවා ගන්නා ආකාරය පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2 **නිෂ්කාර්ය වත්කම්**

------------------

2014 ඔක්තෝබර් 10 දින සභා බහුකාර්ය ගොඩනැගිල්ලේ තිබෙන නිල නිවාස 02 ක් සඳහා රු.70,544 ක් වටිනා උපකරණ මිලදී ගෙන තිබූ නමුත් 2015 දෙසැම්බර් මස වන විටද ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

4.1 **අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ දී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේ දී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකොට නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

ප්‍රවර්තන වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) තොග පාලනය